1986 වර්ෂයේදී මහනුවර කෑගල්ල ගම්පහ රත්නපුර සහ කලුතර දිස්ත්‍රික්ක වලින් තම්තම් ශෙඩ් විදින කෘමියාගේ පරපෝෂිතයන් එකතු කරන ලදී. රසායනාගාර වලදී එම පරපෝෂිතයන් බෝ කිරීම සහ ඔවුන්ගේ ජිවන චක්‍රය අධ්‍යයනය කිරීමත් සිදුවිය. මෙසේ හඳුනාගත් පරපෝෂිතයින් වර්ග දෙකෙක් මෙසේය.

- සෙරප්‍රක් ඇග්විතල්ඩොයි
- හෝලිපස්
- පැරපිලැක්ස්
- පෙඩියෝබියස්
- බ්‍රැකන්
- ඉලැස්මස්
- පැරපිලැක්ස් වාටස්
- ත්‍රිකොනොටොමියා

1987 වර්ෂයේදී මෙම අධ්‍යයන නිම කරන ලදී. 1987 මාර්තු 20 වනදා මෙම කෘමීන් නැගෙනහිර මැලේසියාවට ගෙන යන ලදී.

මෙම පියවර මගින් නැගෙනහිර මැලේසියාවේ මුදල් උල්පතක් වන කොකෝවා වගාවට යහපතක් අපේක්ෂා කෙරේ.



## කපු පේලි අතර රනිල බෝග වගා කිරීම

මීටර් 1.3 පරතරය ඇති යුගල පේලිවල කපු වගා කරන ලදී. යුගල පේලියක, පේලි දෙක අතර පරතරය මීටර් 0.6 කි. පේලිය තුල මීටර් 0.3 දුරින් සෑදූ වලවල් වල කපු පැල 2 බැගින් තවත්තු කරන ලදී. යුගල පේලි 2 ක් අතර රනිල බෝග පේලි 3 බැගින් සිටුවන ලදී.

| බෝග සංකලනය | හෙක්ටාර් 1 ක් ආදායම (රුපි) |
|---|---|
| කපු + රටකජු (අංක 45 ප්‍රභේදය) | 17,460 |
| කපු + රටකජු (ඇම්.අයි. 5 ප්‍රභේදය) | 16,525 |
| කපු + සෝයා බෝංචි (පි බී 1 ප්‍රභේදය) | 13,632 |
| කපු + කව්පි (ඇම්. අයි. 35) | 13,908 |
| කපු පමණයි | 12,462 |